| | | | |
|---|---|---|---|
| දිනය<br>Date | 2025.10.20<br>පැය 1800 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 |
| මගේ අංකය<br>My NO | D/Media/Out/1920 /2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |

## අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසය (PCID )විවෘත කිරීම – පොලිස් මූලස්ථානය.

**අභිනවයෙන් ස්ථාපිත කරන ලද අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසය (Proceeds Of Crime Investigation Division)** 2025.10.20 වන අද දින උදෑසන කාලයේ කොළඹ 01 පිහිටි පැරණි පොලිස් මූලස්ථාන ගොඩනැගිල්ලේදී **ගරු මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ආනන්ද විජේපාල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදි.**

මෙම අවස්ථාව සඳහා **මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම් රවී සෙනවිරත්න මහතා හා පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා** සහභාගී වන ලදී.

මෙම කොට්ඨාසයේ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අසංග කරවිට මහතා පත් කර ඇත. මෙහිදී එතුමා විසින් පනතෙහි ක්‍රියාකාරීත්වය මෙන්ම එමගින් පොලිස් නිලධාරීන්ට පැවරී ඇති බලතල හා කාර්යභාරය පිළිබඳව සවිස්තරාත්මකව විග්‍රහයක් සිදුකරන ලදි.

මෙම කොට්ඨාසය ස්ථාපිත කරන ලද 2025 අංක 5 දරණ අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතෙහි බලාත්මක අධිකාරීන් වශයෙන් ශ්‍රී ලංකා පොලිසිය හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහන් කර ඇත. පනතෙහි සියළු විමර්ශන බලතල පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් විසින් සිදු කිරීමට බලතල පැවරී ඇති අතර යම් අපරාධයකින් උත්පාදිත දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කල යුතු ආකාරය සම්බන්ධව අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ මෙතෙක් පැවති සීමිත බලතල වඩාත් පුළුල් පරාසයක් තුල විග්‍රහ කිරීම මෙම පනත මඟින් සිදු කර ඇති බවත් ඒ අනුව කටයුතු කිරීමට මෙම කොට්ඨාසයට බලතල පැවරී ඇත.

සංවිධානාත්මක අපරාධකරුවන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඇතුළු අපරාධකරුවන් අනීතික ලෙස උත්පාදනය කර ගන්නා දේපළ සම්බන්ධයෙන් පනතෙහි නෛතික ප්‍රතිපාදන ප්‍රකාරව කඩිනමින් නීතිය ක්‍රියාත්මක කිරීම මෙම නව කොට්ඨාසය මඟින් සිදු කෙරෙනු ඇත.

මෙම අවස්ථාව සඳහා නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය හා අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂවරුන් ඇතුළු නිලධාරින් රැසක් මෙම අවස්ථාවට සහභාගි විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප
















**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**